නිවිතිගල ප්‍රාදේශීය සභාව
රත්නපුර දිස්ත්‍රික්කය

01 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 18 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූනි 30 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය.
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට නිවිතිගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2016 වර්ෂය තුලදී ගෙවීම් කරන ලද සමාලෝචිත වර්ෂයට අදාල එකතුව රු. 76,309 ක වියදම් සඳහා ණයහිමියන් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂයේ වියදම සහ ණයහිමියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී මිලදී ගත් රු. 59,180 ක් වටිනාකමැති ස්ථාවර වත්කම් ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම හරහා ගිණුම්ගත කර නොතිබූ බැවින් වර්ෂයේ වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී පරිත්‍යාග වශයෙන් ලද රු. 3,725,150 ක් වටිනාකමැති ස්ථාවර වත්කම් පරිත්‍යාග සංචිත ගිණුම හරහා ගිණුම්ගත කර නොතිබූ බැවින් වර්ෂයේ වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව රු. 348,985 ක් වටිනාකමැති ස්ථාවර වත්කම් ඉවත් කිරීමට හා වෙන්දේසි කිරීමට නිර්දේශ කර තිබූ නමුත් එම ක්‍රියාවලිය විගණිත දිනය වනවිටත් සිදුකිරීමට කටයුතු කර නොතිබූ නමුත් ජ'නල් සටහන් 12 මඟින් අදාල වත්කම් ගිණුම් වලින් කපා හැර තිබුණි.

(ඉ) 2015 මැයි 15 දින සිට සභාවේ නිල කාලය අවසන් වී තිබුණි. සභිකයින් වෙත 2015 මැයි මස සඳහා මන්ත්‍රී දීමනා වශයෙන් රු.190,000 ක් ගෙවා තිබූ නමුත් ප්‍රතිපූර්ණය වී තිබුණේ 2015 සභිකයින්ට හිමි දින 15 වැටුප වන රු. 95,000 ක් පමණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ වැටුප් වියදම රු.95,000ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 02 කට අදාලව සමාලෝචිත වර්ෂයේ අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛණ අනුව ශේෂයන් අතර රු. 166,494 ක වෙනසක් දක්නට ලැබුණි.

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 2,278,963 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 3,130,970 ක් විය.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය මෙහෙයුම් අතිරික්තය රු. 852,007 කින් අඩුවී තිබූ අතර, එය පසුගිය වර්ෂයට වඩා සියයට 27 ක අඩුවීමක් බව නිරීක්ෂණය විය. මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්ථන ආදායම් වල අඩු වීම හා වැටුප් හා දීමනා වල සියයට 42 ක වැඩිවීමකි.

### 2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ලේකම්වරයා විසින් ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 2,700 | 2,736 | 1,979 |
| බදු කුලී | 4,536 | 3,873 | 87 |
| බලපත්‍ර ගාස්තු | 513 | 290 | 1.5 |
| වෙනත් ආදායම් | 28,060 | 28,865 | 7,665 |

2.3.2. ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය

-------------------------------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් හා බදු, බදු කුලී ආදායම, බලපත්‍ර ගාස්තු, වරෙන්තු හා දඩ සහ වෙනත් ආදායම් යන ආදායම් විෂයයන් රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 16, සියයට 14, සියයට 43, සියයට 46 හා සියයට 5 ක අඩුවීමක් පෙන්නුම් කෙරිණි.

2.3.3 වරිපනම් බදු

--------------

සභාවේ වරිපනම් බදු ලේඛණයේ නම සංශෝධනය කිරීම සඳහා 2014 හා 2015 වර්ෂයේදී ලැබී තිබූ වාර්ෂික වටිනාකම රු. 696,085 ක්වූ අයඳුම් පත්‍ර 44 ක කාර්යය නිමකර නම සංශෝධනය කිරීම සිදුකර තිබුණද, ඒ සඳහා සභා තීරණයක් මඟින් විධිමත් පරිදි අතුරු ව්‍යවස්ථා පනවා ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.4 වෙළඳ බලපත්‍ර ගාස්තු

------------------------

2014 වර්ෂයට සාපේක්ෂව 2015 නොවැම්බර් මස වනවිටද ව්‍යාපාරිකයින් 89 දෙනෙකු විසින් වෙළඳ බලපත්‍ර ලබා නොගැනීම හේතුවෙන් සභා අරමුදලට රු. 52,250 ක් අහිමි වීමේ අවදානමක් ඇති වී තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

2.3.5 වෙනත් ආදායම්

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිවිතිගල නගරයේ නවතා තබන රථ වාහන වලින් ගාස්තු අයකර ගැනීම සඳහා රථ වාහන පාලිකාවක් කොමිස් පදනම මත පත් කරගෙන තිබුණද මාසිකව එකතු වන ආදායම 2015 ජනවාරි සිට ජූනි දක්වා රු. 25,000 ක් පමණ ඉතා අඩු මට්ටමක පැවතින තවද, එකතු කරනු ලබන ආදායමින් සියයට 70 ක් වැනි විශාල ප්‍රතිශතයකින් කොමිස් මුදල් ගෙවාතිබූ අතර, සභා අරමුදලට බැර වන ආදායමට සාපේක්ෂව වියදම ඉතා ඉහල අගයක් ගන්නා බවත්, රථ වාහන ඉතා විශාල ප්‍රමාණයක් නවතා තබන නිවිතිගල නගරයේ එකී අය විෂයයෙන් උත්පාදනය වන ආදායම ඉතා දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

(ආ) නිවිතිගල සතිපොලේ පෙර ගෙවුම් මුදල් සම්බන්ධව 2004 වර්ෂයෙන් පසු කිසිඳු තොරතුරක් සභාව සතුව නොමැති බවද 2004 වර්ෂයේ පෙරගෙවුම් මුදල් ලේඛණය අනුව රු. 369,560 ක් කඩකාමර 02 කින් අයවිය යුතු බවද දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි මස සිට ජූනි මස දක්වා සභාවේ ලියාපදිංචි කල ත්‍රීරෝද රථ සංගම් 04 ක් මඟින් රු. 26,600 ක ආදායමක් ලබාගෙන තිබූ නමුත් අතුරු ව්‍යවස්ථා පනවා විධිමත් පරිදි ගාස්තු අයකර ගැනීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක නොකිරීම මත 2015 වර්ෂයේ ජූනි මාසයෙන් පසුව මෙකී විෂයයෙන් කිසිඳු ආදායමක් අයවී නොතිබුණි.

(ඇ) නිවිතිගල සතිපොල අසල පිහිටි සභාව සතු කඩකාමර 12 ක් සඳහා 2011 ජනවාරි 12 දිනැතිව හා 2014 දෙසැම්බර් 05 දිනැතිව දෙවරක් මාසික කුලිය තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කර තිබූ නමුත් විගණිත දිනය වූ 2015 නොවැම්බර් 09 දින දක්වාම එම සංශෝධිත බදු මුදල් අයකර ගැනීමට කටයුතු නොකිරීමෙන් සභාවට රු. 42,550 ක ආදායමක් අහිමි වී තිබුණි.

2.3.6 මස් කඩ බදු

--------------

සභාව විසින් 2014 වර්ෂය සඳහා එළු හා කුකුල් මස් කඩය බදු දීම වෙනුවෙන් ගිවිසුම් අත්සන් කර තිබූ බදුකරු 2014 ජනවාරි මස පමණක් බදුකුලී ගෙවා පෙබරවාරි මස සිට බදු කුලී ගෙවීම පැහැරහැර ඇති බැවින් 2014 අප්‍රේල් 29 දිනට රු. 85,500 ක මුදලක් සභාවට අයවිය යුතුව තිබුණි. මෙම හිඟ මුදල් සභාවට අයකර ගැනීමට විගණිත දිනය වූ 2015 නොවැම්බර් මස 09 දින දක්වා කටයුතු කර නොතිබුණි

2.3.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා රු. 1,353,372 ක් හඳුනාගෙන ඇතත්, ජූනි මස සිට සැප්තැම්බර් මස දක්වා උසාවි දඩ ආදායම රු. 389,415 ක් සභාවට අයකර ගැනීමට කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති අතර, ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා උසාවි දඩ ආදායම් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මුද්දර ගාස්තු වලට අදාල උපලේඛණ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය මගින් ගෙන්වා ගෙන නියමිත ආදායම ගිණුම්ගත කල යුතු වුවත්, ඒ සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 තොග පාලනය

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව විසින් 2015 අප්‍රේල් 08 දින මිලදී ගත් රු. 472,285 ක් වටිනාකමැති හියුම් පයිප්ප 90ක් අවශ්‍යතා හඳුනාගෙන ප්‍රතිලාභීන් තෝරා ගැනීම පිළිබඳව විධිමත් ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබූ බවද, එම භාණ්ඩ බෙදාහැරීමෙන් පසු භාණ්ඩ යොදාගත් බවට කාර්මික නිලධාරීගේ වාර්තා සහිත නිසි පසුවිපරමක් සභාව විසින් සිදු කර නොතිබුණි.

(ආ) 2014 හා 2015 වර්ෂ සඳහා, වූ අයවැය ප්‍රතිපාදන මගින් මන්ත්‍රී යෝජනා යටතේ මන්ත්‍රීවරුන් විසින් භාණ්ඩ බෙදාදුන් ආයතන හෝ පුද්ගලයින් අතර එම භාණ්ඩ ලබා දීමේදී ප්‍රතිලාභීන් තෝරා ගැනීම පිළිබඳව විධිමත් ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබූ බවද එම භාණ්ඩ බෙදාහැරීමෙන් පසු අදාල කාර්යය වෙනුවෙන් එකී භාණ්ඩ යොදාගත් බවට නිසි පසුවිපරමක් සභාව විසින් සිදුකර නොතිබුණි. තවද, මිලදී ගන්නා ලද යථෝක්ත භාණ්ඩ සම්බන්ධයෙන් විධිමත් මිල කැඳවීමක් සිදු කර ඇගයීමකට ලක් කිරීමෙන් අනතුරුව අදාල මිලදී ගැනීම් කල බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. මිලදී ගන්නා ලද යථෝක්ත භාණ්ඩ අතරින් භාණ්ඩ කිහිපයක් තොග පොතේ ඇතුලත් කර නොතිබූ අතර, තොග පොතේ ඇතුලත් කරන ලද භාණ්ඩ සඳහාද නිකුත් කිරීමේ නියෝග ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන ලේඛණයේ භාණ්ඩ බෙදාහැරීම් වලට අදාල නියැදි පරීක්ෂාවේදී මන්ත්‍රීවරුන් සඳහා කිසිඳු ලිඛිත ඉල්ලීමකින් හෝ ස්ථානය සම්බන්ධව සභාවට කිසිඳු තහවුරු කිරීමකින් තොරව රු. 37,250 ක් වටිනාකමැති වීථි පහන් කට්ටල 25 ක් ලබා දී තිබූ අතර, එම වීථි පහන් සම්බන්ධව කිසිඳු පසුවිපරමක්ද සභාව විසින් සිදුකර නොතිබුණි. තවද, 2015 ඔක්තෝබර් 26 දින වනවිට ගබඩා ලේඛණය අනුව වීථි පහන් කට්ටල 14 ක් ගබඩාවේ පවතින බවට තොග පොතේ සඳහන් වුවද, 2015 නොවැම්බර් 05 දින සිදු කරන ලද ගබඩා පරීක්ෂාවේදී වීථි පහන් කට්ටල වලට අදාල කොටස් පමණක් නිරීක්ෂණය විය.

(ඈ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වීථි පහන් සවිකිරීම පිළිබඳව විධිමත් වැඩපිළිවෙලක් හඳුනාගැනීමට නොහැකි වූ අතර, වීථි පහන් අවශ්‍යතාවය පිළිබඳ ප්‍රදේශයේ සමීක්ෂණයක් සිදුකර ස්ථාපනය කර ඇති ස්ථාන පහසුවෙන් හඳුනාගත හැකි පරිදි විධිමත් ලේඛණයක් නඩත්තු කර වීථි පහන් අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා ගෙන මිලදී ගැනීම සිදු නොකරන බව නිරීක්ෂණය විය. තවද, විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති චක්‍රලේඛය මඟින් වීථි අලෝකකරණය සම්බන්ධයෙන් වන උපදෙස් පිළිබඳව සලකා බැලීමකින් තොරව වීථි අලෝකකරණය ක්‍රියාත්මක වන අතර, වීථි පහන් සවි කිරීම සඳහා ප්‍රාදේශීය සභාව ලංකා විදුලි බල මණ්ඩලය සමඟ ඇතිකරගත් එකඟතාවයන්ද විගණනයට ඉදිරිපත් නොවුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතුව සිටි නිලධාරීන් ගෙන් අයවීමට තිබූ රු. 88,146 ක ණය ශේෂයක් වර්ෂ ගණනාවක සිට නැවත අයකර ගැනීමට නොහැකිව තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 206 (ඇ) නියමය පරිදි තැන්පත් ආපසු ගෙවීමේදී වවුචරයේ නම සඳහන් ආදායකයාට ගෙවීම ලැබීමට හිමිකම් ඇති බවට සහතික කල යුතු බව දක්වා තිබියදී, 2015 වර්ෂයේදී නිවිතිගල සතිපොල බදු එකතු කිරීම සඳහා ලංසු ඉදිරිපත් කිරීමේදී ලබාගත් ටෙන්ඩර් ඇප මුදල වූ රු. 25,000 ක් 2015 පෙබරවාරි 09 දිනැති අංක 106 වවුචරය මඟින් වෙනත් තැනැත්තෙකුට ලබා දී තිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන ලද ගමින් ගමට දොරින් දොරට වැඩසටහන යටතේ සිදු කරන ලද කර්මාන්ත 19 ක ඉදිකිරීම් අවසන් කර තිබූ නමුත් රු. 13,625,430 ක ඉදිකිරීමට අදාල මුදල් ප්‍රතිපාදන සලසා නොගැනීම හෝ අදාල ප්‍රතිපාදන මුදල් සභාවට නොලැබීම හේතුවෙන් කොන්ත්‍රාත්තු වල අවසන් ගෙවීම් සිදුකර නොතිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

----------------------------

නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

------------------------------------------

පල්ලෙගෙදර සමුපකාර සමිතිය සතුව පැවති පල්ලෙගෙදර සම් භාණ්ඩ කර්මාන්ත ශාලාව 2014 ඔක්තෝබර් 30 දින සභාව වෙත පවරා දී තිබූ නමුත් එදින සිට 2016 ජුනි 30 දින දක්වා කර්මාන්ත ශාලාව නිෂ්කාර්යයව වසා දමා තිබුණි.

04. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය.

------------------------------------------

4.1 අයවැය පාලනය.

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 42 කට අදාලව රු. 5,673,854 ක මුළු ප්‍රතිපාදන කිසිඳු කාර්යයක යොදාගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී වැය ශීර්ෂ 08 කට අදාල අයවැයගත මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු. 1,844,000 ක් වුවද, එම වැය ශීර්ෂ වලට අදාල තත්‍ය වියදම රු. 2,448,727 ක් වීම හේතුවෙන් රු. 604,727 කින් අයවැයගත ප්‍රතිපාදන ප්‍රමාණය ඉක්මවා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී වැය ශීර්ෂ 22 කින් වැය ශීර්ෂ 13 කට රු. 10,654,145 ක මුළු ප්‍රතිපාදන මාරු කර තිබූ නමුත් ඒ සඳහා සභා තීරණයක් හෝ කමිටු නිර්දේශයක් ලබාගෙන නොතිබුණි.

4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර ඒ අනුව කටයුතු කර නොතිබුණි.

4.3 අභ්‍යන්තර විගණනය

------------------------

අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ඒ සඳහා අවශ්‍ය පහසුකම් සපයා ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

4.4 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

----------------------------------------------------------

විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

05. පද්ධති හා පාලනය

-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය